# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2147/27 - 2019 ඔක්තෝබර් මස 28 වැනි සඳුදා - 2019.10.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පොළොන්නරුව මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන පොළොන්නරුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ පොළොන්නරුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ මොහමදු ඉබ්‍රහීම් මොහමදු අර්ෆා අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම පොළොන්නරුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ජයසුන්දර කෝරලේ මුදියාන්සේ රාලහාමිලාගේ සුජීව නිශාන්ත ගුණතිලක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පොළොන්නරුව මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, ලීලනාත් වික්‍රම ආරච්චි වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ජයසුන්දර කෝරලේ මුදියාන්සේ රාලහාමිලාගේ සුජීව නිශාන්ත ගුණතිලක, පොළොන්නරුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ලීලනාත් වික්‍රම ආරච්චි,
තේරීම්භාර නිලධාරී,
පොළොන්නරුව මහ නගර සභාව.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පොළොන්නරුව දිස්ත්‍රික්කය.

1A - G 31103 — 27 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*